(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(4).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2018 දෙසැම්බර් 07 වැනි සිකුරාදා**

---

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 5/'18

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා

ගරු වජිර අබේවර්ධන මහතා,— රජයේ මාධ්‍ය ආයතනවල සභාපතිවරයන් සහ අධ්‍යක්ෂක මණ්ඩල ඇතුළත්ව නීත්‍යානුකූල නොවන පත්වීම් ලද සියල්ලන් විසින් නීති විරෝධී ආකාරයෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔවුනට එරෙහිව නඩු පැවරිය යුතු බව,— 2018 ඔක්තෝබර් 26 වැනි දින ගරු රනිල් වික්‍රමසිංහ මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව අග්‍රාමාත්‍ය තනතුරෙන් ඉවත් කර ඇති හෙයින්ද;

අග්‍රාමාත්‍ය, අමාත්‍ය, රාජ්‍ය අමාත්‍ය සහ නියෝජ්‍ය අමාත්‍ය යන තනතුරු නීත්‍යානුකූලව දරන පුද්ගලයන් නොමැති බව කථානායකවරයා විසින් ප්‍රකාශ කර ඇති හෙයින්ද;

අග්‍රාමාත්‍යවරයා නීති විරෝධී ආකාරයෙන් ඉවත් කිරීමෙන් පසු සිදු කරන ලද සියලු කටයුතු සහ ලබා දෙන ලද පත්වීම් ආරම්භයේ සිටම නීති විරෝධී සහ අවලංගු වන හෙයින්ද, එවැනි නීති විරෝධී පත්කිරීම් තුළට සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, රූපවාහිනි සංස්ථාව සහ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය යන රජයේ මාධ්‍ය ආයතනවල සභාපතිවරයන් සහ අධ්‍යක්ෂක මණ්ඩල ඇතුළත් වන හෙයින්ද; සහ

මෙකී සියලු පත්කිරීම් සඳහා නීතිමය පදනමක් නොමැති බවත්, කිසිදු පුද්ගලයකු හට එකී තනතුරු දැරීමට සහ/හෝ එකී තනතුරුවල කටයුතු සිදු කරගෙන යෑමට අයිතියක් නොමැති හෙයින්ද;

ඊට අනුකූලව, එකී තනතුරු දැරීමට අදහස් කරන සහ/හෝ එකී තනතුරුවල කටයුතු කරන පුද්ගලයන් නීති විරෝධී ආකාරයෙන් කටයුතු කරන බැවින්, ඔවුනට විරුද්ධව නඩු පැවරිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

පා. 6/’18

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අග්‍රාමාත්‍යවරයාගේ ලේකම් සිරිසේන අමරසේකර මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින් අග්‍රාමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ ලේකම් සිරිසේන අමරසේකර මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අග්‍රාමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම ආයතනය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී සිරිසේන අමරසේකර මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

පා. 7/’18

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයාගේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින්, මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම අමාත්‍යාංශය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී එස්. ආර්. ආටිගල මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

පා. 8/’18

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින නිවාස හා සමාජ සුබසාධන අමාත්‍යවරයාගේ ලේකම් උපාලි මාරසිංහ මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින්, නිවාස හා සමාජ සුබසාධන අමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ ලේකම් උපාලි මාරසිංහ මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම අමාත්‍යාංශය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී උපාලි මාරසිංහ මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

පා. 9/’18

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින ජාත්‍යන්තර වෙළඳ සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයාගේ ලේකම් එස්. ටී. කොඩිකාර මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින්, ජාත්‍යන්තර වෙළඳ සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ ලේකම් එස්. ටී. කොඩිකාර මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම අමාත්‍යාංශය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී එස්. ටී. කොඩිකාර මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

ගරු  පාඨලී චම්පික රණවක මහතා

ගරු  ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු  රවී කරුණානායක මහතා

ගරු  (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු  අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු අර්ජුන රණතුංග මහතා,— නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින වෙළඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයාගේ ලේකම් බර්නාඩ් වසන්ත පෙරේරා මහතා ජනරජයේ අරමුදල් අඛණ්ඩව අවභාවිතා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු බව,— 2018 නොවැම්බර් 30 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අශෝභන ලෙස නොසලකා හරිමින්, වෙළඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා යැයි නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින තැනැත්තාගේ  ලේකම් බර්නාඩ් වසන්ත පෙරේරා මහතා විසින් එකී නීත්‍යානුකූල නොවන අයුරින් පෙනී සිටින අමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා ජනරජයේ අරමුදල් යොදා ගනිමින් සිටින හෙයින්ද;

ඊට අනුකූලව, එම අමාත්‍යාංශය ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී  බර්නාඩ් වසන්ත පෙරේරා මහතා යෝග්‍ය පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.